# ඉතිහාසය

## 7.1.4 හීම සමය ඇරඹීම



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

# භීම සමය ඇරඹීම ( 1793 - 1795 )

## ජැකොබින්වරුන් වෙත බලය පැවරීම

1793 - 1795 අතර කාලය භීම සමය ලෙස හැඳින්වේ. රටේ ආරක්ෂාව පිළිබඳ තිබූ අවශ්‍යතා නිසා වාද විවාද පැවැත්වීමට හෝ සාකච්ඡා කිරීමට කාලය නොතිබුණි. ප්‍රතිපත්ති සකස් කිරීමත්, ඒවා ක්‍රියාත්මක කිරීමත් ස්වල්ප දෙනෙකු වෙත පැවරුණ අතර ආරක්ෂක කටයුතු සඳහා කාරක සභාවක් ද නීති කඩකරන අයට දඬුවම්කිරීමට විප්ලවකාරී අධිකරණ මණ්ඩලයක් ද පිහිටුවා ඒවායේ බලය භීෂණයේ නියමුවන් ලෙස ක්‍රියා කළ ජැකොබින් නායකයන් වූ ඩැන්ටන් හා රොබස්පියර් වෙත පවරන ලදි. තමන්ට විරුද්ධ වීම ද්‍රෝහී ක්‍රියාවක් ලෙස අර්ථ නිරූපණය කළ ජැකොබින්වරුන් විසින් කලක් බලයේ සිටි ගිරොන්ඩින් නායකයන් බොහෝමයක් මරණයට පමුණුවන ලදි. රදළයන්, පූජකයන් ජැකොබින් විරෝධී විප්ලවවාදීන් රටේ සතුරන් ලෙස සැක කොට ජීවිතක්ෂයට පත් කරන ලදි. මාස හතරක් ඇතුළත ප්‍රංශයේ නැන්ටීස් නම් ස්ථානයේ දී 4000 ක් ද ලියෝන් නම් ස්ථානයේ දී 2000 ක් ද දින පනහක් ඇතුළත තවත් ස්ථානයක දී 1,500 ක්ද මරා දැමූ බව වාර්තා වේ.

## ජැකොබින්වරු අතර මතභේද පැන නැගීම

ජැකොබින්වරු අතර ගැටුම් ඇති වූයේ රොබෙස්පියර්ගේ ප්‍රතිපත්ති ගැන කලකිරුණු ඩැන්ටන් රොබෙස්පියර්ට එරෙහි වීමෙනි. ඩැන්ටන් විප්ලවවාදියෙකු ලෙස සැලකූ රොබස්පියර් ඩැන්ටන් ඝාතනය කළේ ය.අනතුරුව රොබස්පියර්ගේ විරුද්ධවාදීහු විසින් 1794 ජූලි මාසයේ දී රොබස්පියර් ජීවිතක්ෂයට පත් කරන ලදි. භීෂණයේ නියමුවන් විනාශයට පත් කළ පසු ඔවුන් ප්‍රංශයට හඳුන්වා දී තිබූ විප්ලවකාරී අධිකරණය ද මහජන ආරක්ෂක මණ්ඩලය ද, ජැකොබින්වරුන්ගේ දේශපාලන සංවිධාන ක්‍රමය ද අහෝසි කර දමන ලදි. මෙසේ ජැකොබින්වරුන්ගේ භීෂණය තුරන් කිරීමට ගෙන ගිය ව්‍යාපාරය තර්මිඩෝරියන් ප්‍රතික්‍රියාව ලෙස හඳුන්වනු ලැබේ.

## නව ආණ්ඩු ක්‍රමයක් රටට හඳුන්වා දීම

ජැකොබින්වරු යටතේ ප්‍රංශ මන්ත්‍රණ සභාව බල රහිත කොට තිබූ නමුත් තර්මිඩෝරියන් ප්‍රතික්‍රියාව සමග යළිත් එම සභාවට වැදගත්කමක් ලැබුණි. විධායක බලය තනි පුද්ගලයෙකු වෙත නොව මණ්ඩලයකට පවරන ආකාරයේ නව ආණ්ඩුක්‍රමයක් රටට හඳුන්වා දීමට ප්‍රංශ මන්ත්‍රණ සභාව 1795 දී පියවර ගන්නා ලදි. 1795 සිට ක්‍රියාත්මක වූ එම ආණ්ඩුක්‍රමය යටතේ සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයකට විධායක බලය පැවරිණි. ව්‍යවස්ථාදායක කටයුතු සඳහා වෙන ම සභා දෙකක් පිහිටුවන ලදි. සාමාජිකයන් 500ක ගෙන් සමන්විත වූ පහළ සභාවට නීති සම්පාදනය කිරීමේ බලය පැවරිණි. පහළ සභාවෙන් ඉදිරිපත් කරන පනත් සම්මත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට බලය උත්තර සභාවට පැවරිණි. මෙම සභාවට රාජාණ්ඩුවාදීන් බහුතරයක් පත්වුව හොත් විප්ලවයෙන් ඇතිවූ ප්‍රතිඵල අහෝසි කිරීමේ අවදානමක් පැවති හෙයින් එය වළක්වනු සඳහා එම සභාවේ සාමාජිකයන්ගෙන් 2/3 ක් මන්ත්‍රණ සභාවේ සාමාජිකයන්ගෙන් තෝරාගත යුතු යැයි නීතියක් ද පනවන ලදි.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk